**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘති 2 (ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - ආසියානු සංවර්ධන බැංකුව - ගිවිසුම් අංක 3029 සහ 3030 එස්.ආර්.අයි.) - 2024**

-----------------------------------------------------------------------------------------------------------------------

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ - 2 ව්‍යාපෘතියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 ජූනි 03 දින එළඹි අංක 3029-එස්ආර්අයි සහ 3030-එස්ආර්අයි(එස් එෆ්) දරන ණය ගිවිසුමේ II පරිච්ඡේදයේ 2.10 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කල යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

වැඩසටහනේ - ව්‍යාපෘති 2 හි ව්‍යාපෘති හා ණය ගිවිසුම් වලට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය, වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන - ව්‍යාපෘති 2 ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජලය සේවා පිළිබඳ කාර්යක්ෂමතාවය හා මූල්‍ය තිරසාරත්වය වැඩිදියුණු කිරීම වැඩසටහන - ව්‍යාපෘති 2 හි අරමුණ වේ. ණය ගිවිසුම් අනුව, වැඩසටහන - ව්‍යාපෘති 2හි මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 15,340 කට සමාන එ.ජ.ඩො.මිලියන 118 ක් වූ අතර ඉන් රු.මිලියන 9,100 හෝ සියයට 59.3 කට සමාන එ.ජ.ඩො. මිලියන 70 ක් ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් මගින් මූල්‍යයනය කිරීම සඳහා හා රු.මිලියන 2,340 හෝ සියයට 15.3 කට සමාන එ.ජ.ඩො. මිලියන 18 ක් ආසියානු සංවර්ධන අරමුදලෙන් මූල්‍යයනය කිරීම සඳහා එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 3,900 හෝ සියයට 25.4 කට සමාන එ.ජ.ඩො. මිලියන 30 ක් ශ්‍රී ලංකා රජය විසින් දායක වීමට අපේක්ෂා කර තිබුණි. තවද, වැඩසටහන - ව්‍යාපෘති 2හි මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් රු.මිලියන 13,917 කට සමාන එ.ජ.ඩො. මිලියන 107.05 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සිදු කිරීමට අපේක්ෂිත වැඩසටහන - ව්‍යාපෘති 2හි කාර්යයන් සඳහා වෙන් කර තිබූ අතර රු.මිලියන 1,423 කට සමාන එ.ජ.ඩො. මිලියන 10.95 ක් කොළඹ මහනගර සභාව විසින් සිදු කිරීමට අපේක්ෂිත වැඩසටහන - ව්‍යාපෘති 2හි කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන - ව්‍යාපෘති 2හි කාර්යයන් පිළිබඳ නිරීක්ෂණයන්ගෙන් මෙම වාර්තාව සමන්විත වේ. වැඩසටහන - ව්‍යාපෘති 2හි කාර්යයන් 2014 සැප්තැම්බර් 03 දින ආරම්භ කරන ලද අතර 2019 ජූනි 30 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, 2024 පෙබරවාරි 29 දක්වා වැඩසටහන - ව්‍යාපෘති 2හි කාලය දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.1 හි විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, 2024 දෙසැම්බර් 31 දිනට වැඩසටහන - ව්‍යාපෘති 2හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ

වගකීම යන  කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය  ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු/ විගණන නිරීක්ෂණය | වටිනාකම රු. මිලියන | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 21 හි 39(අ) ඡේදය ප්‍රකාරව, ව්‍යාපෘතියට අදාළ විදේශ ණයට සම්බන්ධ රු.මිලියන 2,671 ක සමානාත්මතා ගැලපුම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. | 2,671 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ණය ආපසු ගෙවීමේ බැඳීමක් නොමැත. එබැවින්, කිසිදු සමානාත්මතා ගැලපීමක් සිදු කර නොමැත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. |
| (ආ) | 2023 වර්ෂයේදී ව්‍යාපෘතිය 01 (ණය ගිවිසුම් අංකය 2948 – එස්ආර්අයි) වෙත රුපියල් මිලියන 12.3 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන තුළ එය ලැබිය යුතු මුදලක් ලෙස වාර්තා කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් ඊට සමාන මුදලකින් අඩුවෙන් වාර්තා වී තිබුණි. | 12.3 | එවකට පැවති විදේශ විනිමය අර්බුදය හේතුවෙන්, ව්‍යාපෘතියට මෙම මුදල පියවීමට බල කෙරුණි. | ගිණුම්කරණ දෝෂය නිවැරදි කළ යුතුය. |

### 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම/ විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි අංක 502(2) සහ 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් එක් එක් ව්‍යාපෘතිය සඳහා වෙන වෙනම ස්ථාවර වත්කම් ලේඛන නිසි ලෙස පවත්වා ගෙන නොතිබුණි. | මෙම වත්කම්වල වටිනාකම් යාවත්කාලීන කිරීම සඳහා ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය 2014 සැප්තැම්බර් 03 දින එහි ක්‍රියාකාරකම් ආරම්භ කළ අතර මූලික ගිවිසුමට සහ ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව 2019 ජූනි 30 වන විට කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, අපේක්ෂිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට කළමනාකාරිත්වය අසමත් වූ අතර ව්‍යාපෘතියේ කාල සීමාව 2024 පෙබරවාරි 29 දක්වා දීර්ඝ කර තිබුණි. ලබා දුන් තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේ ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 99 ක් සහ සියයට 84 ක් විය.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | කොළඹ බටහිර සහ දකුණු කොටස සඳහා ව්‍යාපෘතිය විසින් ඇමරිකානු ඩොලර් 476,373 ක වියදමින් ඩීඑම්ඒ මීටර් 42 ක් ස්ථාපනය කර තිබූ අතර, ඉන් මීටර් 34 ක් ක්‍රියාත්මක නොවන තත්ත්වයේ පැවතුනි. සියලුම මීටර් සඳහා 2023 නොවැම්බර් දක්වා වලංගු වසර 5 ක වගකීමක් තිබියදීත්, ව්‍යාපෘතිය වගකීම ඉල්ලා සිටීමට හෝ නඩත්තු ගිවිසුමකට එළඹීමට අසමත් වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, එන්ආර් ඩබ්ලිව් කළමනාකරණයේ ඵලදායීතාවයට දැඩි ලෙස බලපා තිබුණි. කෙසේ වෙතත්, අනුමත කළ නොහැකි විචලන නියෝගයක් මගින් රුපියල් මිලියන 24.28 ක වියදමක් දරා ව්‍යාපෘති අරමුදල් භාවිතා කරමින් අයි.සී.බී. 03 යටතේ මීටර් 17 ක් අළුත්වැඩියා කර තිබුණි. | සියලුම මීටර් ක්‍රමානුකූලව නඩත්තු කිරීම සඳහා මෙහෙයුම් හා නඩත්තු අංශයට භාර දී ඇති අතර, 2025 මැයි 30 වන විට, යම් හේතූන් නිසා ගෙවීම් ලැබුණු පසු කොන්ත්‍රාත්කරු මගින් දෝෂ හඳුනා ගැනීම් සහ නිවැරදි කිරීම් සිදු කළ හැකිය. | පවතින ගැටලු නිවැරදි කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2025 මැයි 30 විගණන දින වන විට ස්ථාපනය කරන ලද විද්‍යුත් චුම්භක ප්‍රවාහ මීටර් 78 න්, 53 ක් අක්‍රිය තත්ත්වයේ පැවතුණි. එම මීටර් අළුත්වැඩියා කිරීම සඳහා ද්‍රව්‍ය වෙනුවෙන් මුළු එකතුව රුපියල් මිලියන 26.55 ක් වියදම් කර තිබුණි. කෙසේ වෙතත්, රුපියල් මිලියන 15.78 ක වටිනා මීටර්, තොගය තුළ භාවිතයට නොගෙන පැවතුණු අතර, 2028 අප්‍රේල් වන විට කල් ඉකුත් වන රුපියල් මිලියන 1.92 ක් වටිනා බැටරි 53 ක් ඇතුළත් විය. මෙම ප්‍රසම්පාදන නිසි අනුමැතියකින් තොරව ප්‍රධාන කොන්ත්‍රාත්තුවට විචලන ලෙස සිදු කර ඇති අතර සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය නොකර තෝරා ගෙන තිබුණි. | දේශීය වශයෙන් ලබා ගත නොහැකිවීම හේතුවෙන් සියලුම අවශ්‍ය අළුත්වැඩියා ද්‍රව්‍ය දේශීය නියෝජිතයාගෙන් මිලදී ගන ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය දැඩි ලෙස අනුගමනය කළ යුතු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශය උල්ලංඝනය කළ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | අයි.සී.බී. 03 කොන්ත්‍රාත්තුව යටතේ, මූලික ප්‍රමාණ බිල් පත්‍රයට අනුව අවශ්‍ය පාරිභෝගික මීටර් 9,306 ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉක්මවා යමින් මීටර් 26,623 ක් ප්‍රසම්පාදනය කිරීමට ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා අනුමත කර තිබුණි. අතිරික්ත මීටර්වල අවශ්‍යතාවය සත්‍යාපනය කිරීම සඳහා විගණනයට සාක්ෂි ලබාදී නොතිබුණ අතර, කෙසේ වෙතත් සැබෑ අවශ්‍යතාවය මීටර් 10,482 ක් පමණක් වී තිබුණි. තවද ව්‍යාපෘතිය විසින් ඉහත මිලදී ගත් අතිරික්ත මීටර්වල අවශ්‍යතාවයට අනුකූල වන පරිදි වංචනික ප්‍රමාණ බිල් පත්‍රයක් සකස්කර තිබු බව නිරීක්ෂණය විය. | ඇස්තමේන්තුගත ප්‍රමාණය වන 26,623 ක් අදාළ ප්‍රමාණ බිල් පත්‍ර අයිතමය හරහා ව්‍යාපෘතිය විසින් මිලදී ගෙන ඇත. කෙසේ වෙතත්, තීරණාත්මක අධ්‍යයනයකින් පසු, දෝෂ සහිත ජල මීටර් පමණක් ප්‍රතිස්ථාපනය කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය තීරණය කළේය. ඒ අනුව, ඉතිරි මීටර් නිසි භාර දීමේ ක්‍රියා පටිපාටි සහිතව මෙහෙයුම් හා නඩත්තු අංශයට භාර දී ඇත. | එම අසාර්ථකත්වයන් සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීම සඳහා විමර්ශනයක් පැවැත්විය යුතුය. |
| (ඈ) | තෙලවල නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමෙහි පිහිටි අයි.සී.බී. - 04 කොන්ත්‍රාත්තුව සඳහා වන තොග ගබඩා පරිශ්‍රයේ, 2023 දෙසැම්බර් 24 වන විට ආසන්න වශයෙන් රුපියල් මිලියන 351 ක් වටිනා සැලකිය යුතු තොග හිඟයක් වාර්තා වී තිබුණි. ඊට අමතරව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් රුපියල් මිලියන 3.07 ක් පමණ වටිනා, ගලවා ඉවත් කරන ලද ජල මීටර් 3,432 ක්, කොන්ත්‍රාත්කරු විසින් ප්‍රතිස්ථාපනය කිරීමෙන් පසු ආපසු භාර දී නොතිබුණි. | ද්‍රව්‍ය සැසඳීම නිම කළ පසු, අලාභයන් කොන්ත්‍රාත්කරුගේ අන්තර් බිල්පත් වලින් අඩු කරනු ලැබේ. | එම අවභාවිතයන් සඳහා වගකිව යුතු පුද්ගලයන් හඳුනා ගැනීමට විමර්ශනයක් සිදු කළ යුතු අතර, ඔවුන්ගෙන් අලාභ අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | මූලිකව රු.මිලියන 6,990.73 කට ප්‍රදානය කරන ලද අයි.සී.බී. 04 පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව දෙවරක් වැඩි කොට තිබූ අතර, 2025 ජනවාරි මාසය වන විට අවසන් සංශෝධිත වටිනාකම රු.මිලියන 10,056.12 ක් විය. තවද, ඇ.ඩොලර් මිලියන 9.2 ක් සහ ශ්‍රී ලංකා රුපියල් මිලියන 3,906 ක් නව අනුපාත භාවිතා කරමින් විචලන නියෝග සිදු කර තිබූ අතර, මේ හේතුවෙන් මූලික කොන්ත්‍රාත් වටිනාකම සියයට 51 කට වඩා වැඩි අගයකින් වැඩි වී ඇති බව නිරීක්ෂණය විය. මෙය තරඟකාරී ලංසු ක්‍රියාවලියේ විශ්වසනීයත්වය අඩාල කරනු ලබන අතර, ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.13.4 වගන්තියේ නියම කර ඇති පරිදි අවශ්‍ය අනුමැතියකින් තොරව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් පිළියෙල කරන ලද ලංසු ලේඛනවල අසාර්ථකත්වයන්ද පෙන්නුම් කර තිබුණි. | ප්‍රමාණවත් පීඩනයක් නොමැති නිසා, දිස්ත්‍රික් මීණුම් කලාප පිහිටුවීමෙන් පසුව පමණක් කොන්ත්‍රාත්කරුට ජල කාන්දු හඳුනාගත හැකිය. ඒ අනුව, අවසන් දිස්ත්‍රික් මීණුම් කලාපය පිහිටුවන තෙක් සංශෝධිත නල එළීම් ප්‍රමාණය මෙන්ම සංශෝධිත කොන්ත්‍රාත් වටිනාකම පුරෝකථනය කළ නොහැකිය. ඉහත කරුණු හේතුවෙන්, ව්‍යාපෘතියට සංශෝධිත කොන්ත්‍රාත් මුදල කල්තියා පුරෝකථනය කළ නොහැකි විය. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උල්ලංඝනය කළ වගකිවයුතු නිළධාරීන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) | අයි.සී.බී. 03 කොන්ත්‍රාත්තුවෙන් සියයට 27 ක් නියෝජනය කරන එකතුව රු.මිලියන 1,714.73 ක් සහ අයි.සී.බී. 04 කොන්ත්‍රාත්තුවෙන් සියයට 26 කට සමාන රු.මිලියන 1,798.71 ක් අගල් නොකපන තාක්ෂණය භාවිතයෙන් නල යෙදීම සඳහා වෙන් කර තිබුණි. මෙම ක්‍රමවේදය සාමාන්‍යයෙන් ඉහළ පිරිවැයක් දරන විශේෂිත ජාත්‍යන්තර කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදී සලකා බලන තීරණාත්මක සාධකයක් විය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ඒකපාර්ශ්වික ලෙස, යෝජිත අගල් නොකපන ක්‍රමවේදය වෙනස් කරමින් සාම්ප්‍රදායික විවෘත අගල් කැපීමේ ක්‍රමවේදය ප්‍රතිස්ථාපනය කර තිබුණි. මෙම වෙනස හේතුවෙන් තීරණාත්මක ප්‍රමාණ බිල් පත්‍ර අයිතම විෂය පථයෙන් ඉවත් කිරීමට සිදුව ඇති අතර, සැලසුම් අදියරේදී සුදුසු තාක්ෂණය හඳුනා ගැනීමේ සැලකිය යුතු අසාර්ථකත්වයක් පෙන්නුම් කර තිබුණි. එය කොන්ත්‍රාත්තුව සඳහා තරඟකාරී මිලක් ලබා ගැනීමට තිබූ අවස්ථාව අහිමි වීමට හේතු වී තිබුණි. තවද, කොන්ත්‍රාත් | අධික රථවාහන තදබදය සහ මහජන අපහසුතා වළක්වා ගැනීම සඳහා, ව්‍යාපෘතිය සැලසුම් අවස්ථාවේදී අගල් නොකපන ක්‍රමය භාවිතා කිරීමට ව්‍යාපෘතිය තීරණය කරන ලදි. පුරෝකථනය කළ නොහැකි ඉල්ලුමේ වැඩි වීම හේතුවෙන් බොහෝ නල ප්‍රමාණයන් වැඩි කිරීමට අවශ්‍ය වීම නිසා පසුකාලීනව විවෘත අගල් ක්‍රමය භාවිතා කිරීමට අපට සිදු විය.<br><br>ව්‍යාපෘතිය විසින් පිළියෙල කරන ලද ටෙන්ඩර් ලේඛන ඒ සඳහා පත් කරන ලද වෙනම තා.ඇ.ක. විසින් ඇගයීමට ලක් කරන ලදි. අගල් නොකපන ක්‍රමය වෙනුවට, ව්‍යාපෘතිය ප්‍රමාණ බිල් පත්‍රයේ අනුපාත භාවිතයෙන් විවෘත අගල් ක්‍රමය අනුගමනය කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 500 ඉක්මවා වෙනස් නොවීය. | එම වෙනස්කම් වල සැබෑ තත්ත්වය හඳුනා ගැනීම සඳහා මෙම කාරණය සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මුදලෙන් සියයට 10 ඉක්මවන ප්‍රමාණ බිල් පත්‍ර අයිතම ඉවත් කිරීම ප්‍රමාණාත්මක විචලනයක් වන බව නිරීක්ෂණය විය. ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව, එවැනි වෙනස්කම් සඳහා පූර්ව අමාත්‍ය මණ්ඩල අනුමැතිය අවශ්‍ය වන අතර, එය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. ව්‍යාපෘති විචලතා කමිටුව විසින් පමණක් එම විචලතා අනුමත කර තිබුණු අතර , එය ව්‍යාපෘති යහපාලනය සහ විනිවිදභාවය සඳහා ස්ථාපිත ක්‍රියාවලීන්හි බරපතල උල්ලංඝනයක් පෙන්නුම් කර තිබුණි. | | |
| (උ) | ආදායම් නොලබන ජලය සියයට 18 ට අඩු කිරීමේ අරමුණින් ව්‍යාපෘතිය - 02 ආරම්භ කර තිබුණ ද, මාස 123 කට පසුව දිස්ත්‍රික් මිණුම් කලාප 42 න් 25 ක් පමණක් සම්පූර්ණයෙන් නිම කර තිබුණි. කෙසේ වෙතත්, ණය වාරික ගෙවීම් ආරම්භ කර ඇති අතර, 2024 දෙසැම්බර් 31 වන විට රජය විසින් බැඳීම් හා පොලී ගාස්තු ඇතුළුව රු.මිලියන 5,570.65 ක් ගෙවා තිබුණි. | අයි.සී.බී. 04 කොන්ත්‍රාත්කරුට ආදායම් නොවන ජල කළමනාකරණ ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි. ගෙවීම් ලැබුණු පසු මාස හයක් ඇතුළත සියලුම ව්‍යාපෘති ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමට ඔවුන් එකඟ වී ඇත. | රජයට අතිරේක පිරිවැයක් වළක්වා ගැනීම සඳහා ව්‍යාපෘතිය කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 ව්‍යාපෘති අරමුණු වලින් බාහිරව සිදු කරන ලද ක්‍රියාකාරකම්/ගෙවීම්**

| | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති ගිවිසුමේ 2.03(ආ) සහ 2.14 වගන්ති අනුව, ණය අරමුදල් ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ යුතු වුවද, 2022/2023 වර්ෂ වලදී ජල සම්පාදන මණ්ඩලයේ අවශ්‍යතා සඳහා රු.මිලියන 2,152 ක් වටිනා සේවා සම්බන්ධතා ද්‍රව්‍ය ව්‍යාපෘති අරමුදල් භාවිතයෙන් මිලදී ගෙන තිබුණි.<br><br>සාමාන්‍යාධිකාරී , අතිරේක සාමාන්‍යාධිකාරී (මූල්‍ය), අතිරේක සාමාන්‍යාධිකාරී (ජල සම්පාදන | එය අයි.සී.බී.-04 කොන්ත්‍රාත්තුවේ විචලතාවයක් බැවින්, අයි.සී.බී.-04 කොන්ත්‍රාත්තුවේ කාර්ය සාධන සුරක්ෂණය මගින් ද්‍රව්‍ය සැපයුම ආවරණය කරනු ඇත. ඒ අනුව, වෙනම බැඳුම්කරයක් අවශ්‍ය නොවේ. කමිටුවේ නිර්දේශය සමඟ ව්‍යාපෘතිය විසින් ගෙවීම සහතික කරන ලදි. ද්‍රව්‍ය පරීක්ෂණ කමිටුව විසින් නිර්දේශ නොකළ අයිතම සඳහා ගෙවීම සහතික කර නොමැත. මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණයට අනුව අමාත්‍ය | ප්‍රසම්පාදන ක්‍රියාවලි උල්ලංඝනය කළ වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව විමර්ශනයක් සිදු කළ යුතුය. |

ව්‍යාපෘති) සහ ව්‍යාපෘති අධ්‍යක්ෂ මෙම ප්‍රසම්පාදනය සිදු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරමින් අයිබී.සී.-04 කොන්ත්‍රාත්තුවේ අරමුදල් ඉතිරියක් ඇති බව සඳහන් කර තිබුණි. කෙසේ වෙතත්, මෙම මිලදී ගැනීම හේතුවෙන් කොන්ත්‍රාත් වටිනාකම සියයට 49.47 කින් වැඩි වී තිබුණි. කොන්ත්‍රාත්කරුගේ සත්‍ය පිරිවැයන් සහ කොන්ත්‍රාත් කොන්දේසි සමඟ සසඳන විට ඉහළ ඒකක මිල හේතුවෙන් මෙම තනි ප්‍රසම්පාදන කොන්ත්‍රාත්තුවෙන් කොන්ත්‍රාත්කරු රු.මිලියන 628.73 ක අතිරික්ත ලාභයක් (සියයට 29.24) උපයා ගෙන තිබුණි.

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ අනුපාත ඉක්මවා, භාවිතා කරන ලද ඒකක මිල අධිකාරියකින් තොරව සියයට 6 කින් වැඩි කර තිබුණි. අවසන් කොන්ත්‍රාත් වටිනාකම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රකාශිත අනුපාත වලට වඩා රු.මිලියන 341 කින් වැඩි වූ අතර, රජයට රු.මිලියන 300 කට අධික අලාභයක් සිදුව තිබුණි. මීට අමතරව, නිසි පදනමක් හෝ විනිවිදභාවයකින් තොරව විචලතා නියෝගයක් ලෙස එම කොන්ත්‍රාත්කරුට ප්‍රදානය කරන ලද වැඩ සඳහා ලාභය සහ පොදු කාර්ය වියදම් ලෙස රු.මිලියන 265 ක් ගෙවා තිබුණි.

සේවා සම්බන්ධතා 250,000 ක් සඳහා සම්බන්ධතා ද්‍රව්‍ය මිලදී ගැනීමට පෙර පවතින තොග තත්ත්වය තක්සේරු කර නොතිබුණි. 2023 අප්‍රේල් මාසයේ භාර දුන් රු.මිලියන 494.97 ක තොගයේ රු.මිලියන 35.63 ක් වටිනා දෝෂ සහිත භාණ්ඩ ඇතුළත් විය. කාර්ය සාධන සුරක්ෂණයක් හෝ කොන්ත්‍රාත් ගිවිසුමක් නොතිබීම නිසා, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට කොන්ත්‍රාත්කරුට එරෙහිව ක්‍රියා කිරීමට නොහැකි තත්ත්වයක් තිබුණි.

මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා වෙනම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇතිබව කරුණාවෙන් සලකන්න.

| | | | |
|---|---|---|---|
| | කෙසේ වෙතත්, විගණන ගණනය කිරීම් වලට අනුව කොන්ත්‍රාත්කරුට මෙම දෝෂ සහිත භාණ්ඩ තොගයෙන් රු.මිලියන 23.21 ක ලාභයක් උපයා ගැනීමට හැකිව තිබුණි. | | |
| (ආ) | මූලිකව රු.මිලියන 6,354 ක වටිනාකමකින් යුත් බටහිර කොළඹ අයි.සී.බී.- 03 පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව, 2023 ජුනි 26 දිනැති තා.ඇ.ක. වාර්තාවට අනුව රු.මිලියන 9,497.80 දක්වා සියයට 49.47 කින් වැඩි වී තිබුණි. ව්‍යාපෘති කළමනාකරණය විසින් ව්‍යාපෘති ගිවිසුමේ 2.03(ආ) සහ 2.14 වගන්ති උල්ලංඝනය කරමින් සහ ණය සම්පාදකයාගේ පූර්ව අනුමැතියකින් තොරව කොන්ත්‍රාත්කරුගේ සියයට 15 ක ලාභය සහ පොදු කාර්ය වියදම් ඇතුළුව, කොන්ත්‍රාත් විචල්‍යයක් ලෙස රු.මිලියන 1,379 ක් වටිනා රසායනික ද්‍රව්‍ය සහ ජල මීටර ද ප්‍රසම්පාදනය කර තිබුණි. | විදේශ විනිමය ගැටළුව හේතුවෙන් දේශීය බැංකු හරහා ණයවර ලිපි විවෘත කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට නොහැකි වී තිබුණි. එබැවින්, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සමඟ ණයවර ලිපි විවෘත කිරීම සඳහා අයිබී.සී..-03 කොන්ත්‍රාත්කරු හරහා සිදු කිරීමට තීරණය කරන ලදි. අවසාන වශයෙන්, ඉහත ක්‍රියාවලිය අමාත්‍ය මණ්ඩලය විසින්ද අනුමත කරන ලදි. | කොන්ත්‍රාත් කොන්දේසි උල්ලංඝනය කළ වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.4 පද්ධති හා පාලනයන්**

| | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2024 දෙසැම්බර් 31 වන විට සියයට 68 කට සමාන රු.මිලියන 13,881 ක් වටිනා ව්‍යාපෘතියේ වත්කම් ප්‍රාග්ධනීකරණය කර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත භාර දී නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියට අදාළ රු.මිලියන 188 ක වත්කම් ආකෘති පත්‍ර තුළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බටහිර මධ්‍යම) විසින් වත්කම් භාර ගෙන තිබුණු අතර ඔහුම ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස එම වත්කම් භාර දී තිබුණි. එසේම එකතුව රු.මිලියන 194 ක වත්කම් භාරදීමේ ආකෘති වල ප්‍රධාන ගණකාධිකාරී හෝ පිරිවැය ගණකාධිකාරීගේ අවශ්‍ය අත්සන් සහ මුද්‍රා නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනීකරණය ක්‍රියාත්මක වෙමින් පවතින අතර, ප්‍රමාදය සිදුවී ඇත්තේ ප්‍රධාන වශයෙන් මෙම ක්‍රියාකාරකම් සිදු කිරීමට ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය නොමැතිකම නිසාය. | ලබැදියාවන්ගේ ගැටුම් ඇති වීම වැළැක්වීම සඳහා වත්කම් භාරදීමේ ක්‍රියාවලිය ස්වාධීන පාර්ශවයක් විසින් මෙහෙයවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අයි.සී.බී.-03/අයි.සී.බී.04 කොන්ත්‍රාත්තු යටතේ කොළඹ මහ නගර සභාව වෙත සම්පූර්ණ කර භාර දුන් මාර්ග සම්බන්ධයෙන් රු.මිලියන 164.46 ක ආරක්ෂක තැන්පතුව අයකර ගැනීමට ව්‍යාපෘති කළමනාකරණය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම කාරණය කොළඹ මහ නගර සභාව සමඟ සාකච්ඡා කරමින් පවතී. | ආරක්ෂක තැන්පතුව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |